## මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

## ඉතිහාසය - I

නම/ විභාග අංකය: ........................................ කාලය පැය 1 යි

**සැලකිය යුතුයි**

- **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට 1, 2, 3, 4 ලෙස ලබා දී ඇති වරණ අතුරින් වඩා නිවැරදි හෝ වඩාත් ගැළපෙන වරණය තෝරන්න.**
- **ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට අදාළ කව මත X ලකුණ යොදන්න.**

---

01) මහානාම හිමි විසින් රචිත මහාවංශයේ පළමු කොටස නිම වන්නේ
1) දුටුගැමුණු රජ සමය අවසානයෙහි ය
2) වසභ රජ සමය අවසානයෙහි ය
3) මහසෙන් රජ සමය අවසානයෙහි ය
4) වලගම්බා රජ සමය අවසානයෙහි ය

02) ශ්‍රී ලංකාවට පැමිණ "බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය" නම් ග්‍රන්ථය රචනා කරන ලද කතුවරයා වන්නේ
1) මෙගස්තිනිස්
2) ඉබන්බතුතා
3) හියුංසියැං හිමි
4) පාහියන් හිමි

03) මුල් ඓතිහාසික යුගය පැවති කාල වකවානුව ලෙස සැලකෙන්නේ
1) ක්‍රි.පූ. 2400 සිට ක්‍රි.පූ. 1800 දක්වා
2) ක්‍රි.පූ. 12500 සිට ක්‍රි.පූ. 1800 දක්වා
3) ක්‍රි.පූ. 450 සිට ක්‍රි.පූ. 300 දක්වා
4) ක්‍රි.පූ. 750 සිට ක්‍රි.පූ. 450 දක්වා

04) අතීතයේ ගොවියන් විසූ ගම් හඳුන්වා ඇත්තේ
1) කසීකාරගාම
2) කේවට්ටගාම
3) ගෝපාලගාම
4) මණිකාරගාම

05) පහත සඳහන් ස්ථාන ඇසුරින් ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් වාසස්ථානයක් නොවන්නේ කුමක්ද?
1) පාහියන්ගල ලෙන
2) අලිගල
3) කුරුවිට බටදොඹ ලෙන
4) කිතුල්ගල බෙලිලෙන

06) රජුට සහය වූ නිලධාරීන් අතුරින් "රූප අදෙක යනු"
1) කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි
2) වෙළඳ අංශ ප්‍රධානි
3) භාණ්ඩාගාරික
4) නගර පරිපාලක

07) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය ආරම්භ වූයේ
1) මධ්‍යගත පාලනයක් ලෙසිනි
2) විමධ්‍යගත පාලනයක් ලෙසිනි
3) රදළ පාලනයක් ලෙසිනි
4) වැඩවසම් පාලනයක් ලෙසිනි

08) පුරාණ වෙළඳපොළවල් සංවිධානාත්මක පාලනය වූ බව තොරතුරු ලබා දෙන සෙල්ලිපිය වන්නේ
1) මිහින්තලා පුවරු ලිපිය
2) කොන්ඩවට්ටවාන් සෙල්ලිපිය
3) බදුලුටැම් ලිපිය
4) කළුදිය පොකුණ සෙල්ලිපිය

09) වර්තමානයේ කිලෝමීටර් කණු මෙන් අතීතයේ දී ගව්වෙන් ගව්වට ගල් කණු පිහිටුවීමට නියෝග කල රජු වන්නේ

1) නිශ්ශංක මල්ල රජු
2) පළමුවන විජයබාහු රජු
3) මහා පරාක්‍රමබාහු රජු
4) පරාක්‍රම පාණ්ඩ්‍ය රජු

10) ඉතිහාසයේ ප්‍රථමවරට සැලසුම් සහගත සටන් ව්‍යාපාරයකට නායකත්වය ලබාදෙන ලද්දේ

1) පළමුවන විජයබාහු රජතුමා
2) වළගම්බා රජු ය
3) පණ්ඩුකාභය රජු ය
4) දුටුගැමුණු රජු ය

11) අතීතයේ රජුට අයත් ඉඩම්වල වගාකරුවන් ගෙවූ බද්ද වූයේ

1) දකපති
2) බොජකපති
3) මතරමජිබක
4) කෙටුකනබ අය

12) කුරුණෑගල රාජධානි සමයේ අවසන් කාලයේ ජීවත් වූ අයෙකුට අසන්නට නොලැබෙන සිදුවීම සහිත පිළිතුර තෝරන්න.

1) කාලිංග මාඝ ආක්‍රමණය
2) චෝල ආක්‍රමණය
3) කාලංගරායර හා චෝඩගංග ආක්‍රමණය
4) චීන ආක්‍රමණය

13) දකුණු ඉන්දීය කුලී භේවායන්ගේ සහය පැතූ පළමු ලාංකික රජතුමා වන්නේ

1) ඉලනාග රජු
2) අභයනාග රජු
3) පළවෙනි විජයබාහු රජු
4) භාතිකාභය රජු

14) පරමාණුව හා ආංගුලය යන මිමි භාවිතා කරන ලද්දේ

1) කාලය මැනීම සඳහා
2) බර මැනීම සඳහා
3) දිග මැනීම සඳහා
4) අවකාශය මැනීම සඳහා

15) ක්‍රි.ව. 1247 දී චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයා ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙරට පාලකයා වූ රජතුමාගේ නම කුමක්ද?

1) පළමුවන පරාක්‍රමබාහු රජු
2) දෙවන පරාක්‍රමබාහු රජු
3) තෙවන පරාක්‍රමබාහු රජු
4) හතරවන පරාක්‍රමබාහු රජු

16) අතීත කාන්තාවන් සිය රූපලාවන්‍ය කටයුතු පිළිබඳව උනන්දු වූ බවට පුරාවිද්‍යාත්මක සාධක හමුවන ස්ථානයකි.

1) බුත්දල පතිරාජවෙල
2) සීගිරි අලිගල
3) උඩරංචාමඩම
4) බටදොඹ ලෙන

17) අනුරාධපුර රාජධානියට සමගාමීව දකුණේ සංස්කෘතික දියුණුව පිලිබිඹු කරන ලද රාජධානිය

1) කාවරගාම
2) මහානාගහුල
3) මාගම
4) ගුත්තහාලක

18) A හා B තීරු ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

| A | B |
|---|---|
| i. දඹදෙණිය | A- සුභ සෙනෙවි |
| ii. යාපහුව | B- සංඛ සෙනෙවි |
| iii. මිනිපේ | C- බුවනෙකබා ආධිපාද |
| iv. ගෝවින්දමලය | D- ෂෂෂ විජයබාහු |

1) D A B C
2) A B C D
3) A C B D
4) C D B A

19) දියාරු නොවූ අතින් ගෙන අනුභව කළ හැකි පදමට සකස් කරගත් ව්‍යාංජනය හඳුන්වන්නේ

1) කාඩි ඇඹුල ලෙස ය
2) නියඹලාව ලෙස ය
3) යවාගු ලෙස ය
4) ආනම ලෙස ය

20) වේවැල්කැටිය සෙල්ලිපිය අනුව හරක් සොරකම් කළ විට ලබාදුන් දඬුවම වූයේ

1) එල්ලා මැරීම
2) ගෘහදණ්ඩ නීතිය පැනවීම
3) නළලේ මුද්‍රා තැබීම
4) මාඝාත නීතිය පැනවීම

21) පහත A හා B තීරු අධ්‍යයනය කොට නිවැරදි පිළිතුර තෝරන්න.

| | A | B |
|---|---|---|
| i. | යමසිංහ බණ්ඩාර | A- දොන් ජුවාන් |
| ii. | කුසුමාසන දේවිය | B- දොන් පිලිප් |
| iii. | කොනප්පු බණ්ඩාර | C- දෝන කතිරිනා |

1) A C B
2) B C A
3) C B A
4) B A C

- **පහත සඳහන් වගුව ඇසුරින් අංක 22 - 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| කර්මාන්ත ක්ෂේත්‍රය | සොයා ගැනීම | සොයා ගැනීම් කළ තැනැත්තා |
|---|---|---|
| A. පේෂ කර්මාන්තය | D. වාෂ්ප එන්ජිම | G. තෝමස් නිව්කොමන් |
| B. යකඩ හා වානේ කර්මාන්තය | E. ජල රාමුව | H. හෙන්රි කෝට් |
| C. ගල් අඟුරු කර්මාන්තය | F. රෝලර් යන්ත්‍රය | I. රිචඩ් ආක්රයිට |

22) පේෂ කර්මාන්තය සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර වන්නේ

1) A E I
2) A E H
3) A E C
4) A F G

23) ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර වන්නේ

1) A E I
2) C D G
3) B F H
4) C E G

24) ක්‍රි.ව. 1867 වර්ෂයේ දී ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ දුම්රියක් ධාවනය කිරීම සිදුවූයේ

1) කොළඹ සිට කෑගල්ල දක්වා
2) මහනුවර සිට නුවරඑළිය දක්වා
3) කොළඹ සිට මහනුවර දක්වා
4) නුවරඑළිය සිට බදුල්ල දක්වා

25) පෙරදිග ඉන්දීය ප්‍රංශ වෙළඳ සමාගමට අයත් නොවන මධ්‍යස්ථානයකි.

1) කරිකාල්
2) කල්කටා
3) චන්ද්‍රනගර්
4) පොන්ඩිචේරි

26) උඩරට නිදහස් සටන් හා සම්බන්ධ පුද්ගල නාම කිහිපයක් පහතින් දැක්වේ.

A- මඩුගල්ලේ නිලමේ
B- ගොංගාලේගොඩ බණ්ඩා
C- කොහුකුඹුරේ රටේරාල
D- කඩහපොල හිමි
E- කැප්පෙටිපොළ නිළමේ

1818 නිදහස් අරගලය හා සම්බන්ධ පුද්ගලයින් දැක්වෙන පිළිතුර වන්නේ

1) A B C
2) A C E
3) C B E
4) E B D

27) ලංකාවේ බෞද්ධ පුනරුදයේ වැදගත් අවස්ථාවක් ලෙස සැලකෙන 1862 දී ගාල්ලේ දී පිහිටුවනු ලැබූ මුද්‍රණාලයේ නම කුමක්ද?

1) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය
2) සරසවි සඳරැස මුද්‍රණාලය
3) සුදර්ශන මුද්‍රණාලය
4) ලංකෝපකාර මුද්‍රණාලය

- පහත A සිට F දක්වා ඇති ප්‍රකාශ ඇසුරින් 28 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A- පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම.
  B- ව්‍යවස්ථාදායක සභාවට උගත් ලාංකිකයෙකු තේරීපත් වීම.
  C- ලංකා සංගමය පිහිටුවීම.
  D- ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් බහුතරයක් වීම.
  E- ව්‍යවස්ථාදායක සභාව පළමුවරට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීම.
  F- වතු වගාවට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

28) කෝල්බෘක් ප්‍රතිසංස්කරණයෙන් පසුව ඇති වූ යුරෝපීය උද්ඝෝෂණ සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?
1) B හා D  2) C හා F  3) D හා E  4) A හා C

29) කෲව් - මැකලම් අණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණයන් සම්බන්ධ කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද?
1) B හා E  2) A හා D  3) D හා F  4) C හා D

30) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධව තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
1) C හා F  2) B හා D  3) A හා D  4) B හා E

- පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/ පද යුගල අධ්‍යයනය 31 - 33 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 1. කෝපි වගාව
  2. හෙමලියා වෙස්ටර්ට්‍රික්ස්

B 1. පානදුරාවාදය
  2. ඕල්කට්තුමාගේ ලංකාගමනය

C 1. අමද්‍යප උද්ඝෝෂණය
  2. රජයේ සුරාබදු ප්‍රතිපත්තිය

D 1. මහත්මා ගාන්ධි
  2. ලංකා ජාතික සංගමය

31) පළමු වැන්නේ සාර්ථකත්වය දෙවැන්න සිදුවීමට හේතු වූ බව දැක්වෙන ප්‍රකාශ/ පද යුගලය කුමක්ද?
1) A  2) B  3) C  4) D

32) දෙවැන්න හේතුවෙන් පළමුවැන්න සිදුවූ බව ද දැක්වෙන ප්‍රකාශ පද යුගලය කුමක්ද?
1) A  2) B  3) C  4) D

33) දෙවැන්න හේතුවෙන් පළමුවැන්නේ අවසානය සිදුවූ බව දැක්වෙන ප්‍රකාශ/ පද යුගලය කුමක්ද?
1) A  2) B  3) C  4) D

34) ශ්‍රී ලංකාවේ සූරියමල් ව්‍යාපාරය ආරම්භ වීම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
1) සූරියමල නිදහසේ ලකුණ යි.
2) පොපි මල් ව්‍යාපාරයට එරෙහි ව්‍යාපාරයක් ලෙස ආරම්භ වීම.
3) මල් විකිණීමෙන් ලැබෙන මුදල් බ්‍රිතාන්‍යයට යවන ලදී.
4) නිදහස පතා ගෙන ගිය උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරය ලෙස ආරම්භ වීම.

35) ශ්‍රී ලංකාවේ පිහිටන ලද ප්‍රථම දේශපාලන පක්ෂය කුමක්ද?
1) එක්සත් ජාතික පක්ෂය  2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
3) විප්ලවකාරී සමසමාජ පක්ෂය  4) ලංකා සමසමාජ පක්ෂය

36) ශ්‍රී ලංකාවේ ආරම්භ කළ ප්‍රථම බහු කාර්යය සංවර්ධන යෝජනා ක්‍රමය කුමක්ද?
1) මහවැලි සංවර්ධන ව්‍යාපාරය  2) පොල්ගොල්ල සංවර්ධන යෝජනා ක්‍රමය
3) ගල්ඔය සංවර්ධන යෝජනා ක්‍රමය  4) මොරගහකන්ද යෝජනා ක්‍රමය

37) ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාශයක් බවට පත්වන මැතිවරණය කුමක්ද?

1) ජනාධිපතිවරණය
2) මහ මැතිවරණය
3) සමානුපාතික ඡන්ද ක්‍රමය
4) පළාත් පාලන මැතිවරණය

38) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මහ මැතිවරණයකදී පාර්ලිමේන්තුවට ඡන්දයෙන් තෝරා ගනු ලබන නියෝජිතයින් සංඛ්‍යාව වන්නේ

1) 29 කි
2) 196 කි
3) 225 කි
4) 218 කි

39) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දිවයිනේ උත්තරීතරම අධිකරණය වන්නේ

1) අභියාචනාධිකරණය
2) මහාධිකරණය
3) ශ්‍රේෂ්ඨාධිකරණය
4) මහේස්ත්‍රාත් අධිකරණය

40) බෞද්ධාගමික පුනර්ජීවනය වෙනුවෙන් ආරම්භ වූ මාලිගා කන්ද පිරිවෙන මුල් කරමින් ආරම්භ වූ විශ්ව විද්‍යාලය වන්නේ

1) කැලණිය විශ්ව විද්‍යාලය
2) කොළඹ විශ්ව විද්‍යාලය
3) පේරාදෙණිය විශ්ව විද්‍යාලය
4) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය